විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය
எனது இல.
My No. } විවැ /පා15 /ලේස/කා.ක.ඉ.

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2016.06. 24

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සියළුම මාණ්ඩලික නිලධාරීන්/

දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්වරුන් මගින්

අදාල ලේඛන සහකාරවරුන් වෙත

**කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 02 නිලධර ගණය(ලේඛන සහකාර) 11 ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන 11 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 ට සමගාමීව එම නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළුව (2016.06.30 – 2016.07.01)**

2016 ජූලි මාසයේදී පැවැත්වීමට නියමිත ලේඛන සහකාර 11 ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන 11 කාර්යක්ෂමතා කඩ ඉම් විභාගයට සමගාමීව එම විභාගයට අයදුම් කර ඇති නිලධාරීන්ට විෂය නිර්දේශය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දී විභාගයට සූදානම් කිරීම සඳහා නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

02. එම වැඩමුළුවෙහි වැඩසටහන් විස්තරය මේ සමඟ යා කර ඇති අතර ඒ පිළිබඳව ඔබ ආයතනයේ/අංශයේ ඉහත විභාගය සඳහා අයදුම් කල නිලධාරීන් දැනුවත් කරන මෙන්ද, 2016.06.30 හා 2016.07.01 දෙදින ඉහත වැඩමුළුව සඳහා සහභාගී වීමට රාජකාරී නිවාඩු ලබා දීමට කටයුතු කරන මෙන්ද කාරුණිකව දැනුම් දෙමි.

03. එසේම පහත කරුණු පිළිබඳවද නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් වැඩි දුරටත් දන්වා සිටිමි.

- 2016.06.30 දින පරිගණක දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා වන වැඩමුළුවට සහභාගී වන නිලධාරීන් ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් රැගෙන ආ යුතුය.(පෞද්ගලික පරිගණක යන්ත්‍රයක් නොමැති නම් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇති ලැප්ටොප් පරිගණක යන්ත්‍රය රැගෙන එන්න.)

- වැඩමුළුවට සහභාගී වන නිලධාරීන් උදෑසන හා දිවා ආහාර,ලිපිද්‍රව්‍ය සපයා ගත යුතුය.

ඩබ්ලිව්.විතානගේ
අධ්‍යක්ෂ(පාලන හා මානව සම්පත් සංවර්ධන)
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

# වැඩ සටහන් විස්තරය

**ස්ථානය**
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ශ්‍රවනාගාරය

**දිනය සහ වේලාව**
2016.06.30 දින පෙ.ව. 9.00 සිට ප.ව.4.15 දක්වා
2016.07.01 දින පෙ.ව. 9.00 සිට ප.ව.4.15 දක්වා

| | | |
|---|---|---|
| 2016.06.30 | පෙ.ව. 9.00 – පෙ.ව.11.00 | පරිගණක දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රායෝගික පරීක්ෂණය<br>යටතේ දක්වා ඇති විෂය නිර්දේශය<br>එඩ්වඩ් පෙරේරා මයා(තොරතුරු තාක්ෂණ උපදේශක) |
| | පෙ.ව. 11.00 – පෙ.ව.11.15 | තේ පානය |
| | පෙ.ව. 11.15 – ප.ව. 1.15 | පරිගණක දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රායෝගික පරීක්ෂණය<br>යටතේ දක්වා ඇති විෂය නිර්දේශය<br>එඩ්වඩ් පෙරේරා මයා(තොරතුරු තාක්ෂණ උපදේශක) |
| | ප .ව.1.1 5– ප.ව.2.15 | දිවා ආහාරය |
| | ප.ව. 2.15 – ප.ව.4.15 | පරිගණක දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රායෝගික පරීක්ෂණය<br>යටතේ දක්වා ඇති විෂය නිර්දේශය<br>එඩ්වඩ් පෙරේරා මයා(තොරතුරු තාක්ෂණ උපදේශක) |
| 2016.07.01 | පෙ.ව. 9.00 – පෙ.ව.11.00 | දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසි විෂය<br>යටතේ දක්වා ඇති විෂය නිර්දේශය<br>විශ්‍රාම වැටුප් නිලධාරී,එම්.ඩී.මල්සිංහ මයා |
| | පෙ .ව.11.00 - පෙ.ව.11.15 | තේ පානය |
| | පෙ.ව. 11.15 – ප.ව. 1.15 | දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසි විෂය<br>යටතේ දක්වා ඇති විෂය නිර්දේශය<br>විශ්‍රාම වැටුප් නිලධාරී,එම්.ඩී.මල්සිංහ මයා |
| | ප .ව.1.1 5– ප.ව.2.15 | දිවා ආහාරය |
| | ප.ව. 2.15 – ප.ව.4.15 | දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසි විෂය<br>යටතේ දක්වා ඇති විෂය නිර්දේශය<br>විශ්‍රාම වැටුප් නිලධාරී,එම්.ඩී.මල්සිංහ මයා |